City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

# භූමියේ හිමිකම සැමට



තමන්ටම කියා ඉඩමක් ලබා ගැනීම සහ නිවසක් ඉදිකර ගැනීම අප සැමගේ සිහිනයකි. එය සාක්ෂාත් කර ගැනීමට අප විවිධ සාධක පසුපස හඹා යයි. රටේ ජනතාවගේ එම සිහිනය යථාර්තයක් කර දීමට ඇප කැප වී කටයුතු කරනු ලබන ප්‍රමුඛතම අමාත්‍යාංශයකි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය. අද වන විට එම අමාත්‍යාංශය මගින් ජනතාවට එය ඉටු කර දීමට සුවිශාල වූ වැඩ කොටසක් සිදු කරමින් පවතී.

පසුගිය සමය තුළ රටේ පැවති කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය හමුවේ රජය විසින් සංවර්ධන කටයුතු සීමා කෙරිණ. ඒ අනුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයද සිය සංවර්ධන කටයුතු තාවකාලිකව නතර කිරීමට පියවර ගැනිණ. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි මේ වන විට යළි එම කටයුතු ආරම්භ කර තිබේ.

**● මෙම වසරේ දී ප්‍රතිලාභීන්ට හිමිකම් ඔප්පු 1500ක්.**

ඒ අතරින් හිමිකම් ඔප්පු සහ නිවාස ආධාර දිස්ත්‍රික් මට්ටමින් ලබාදීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් පසුගියදා ආරම්භ කෙරිණ. එහි පළමුවැන්න සිදු කෙරුණේ පොළොන්නරුව දිස්ත්‍රික්කය මුල්කර ගනිමිනි.

මෙම වැඩසටහන පැවැත්වුණේ පොළොන්-නරුව, හිගුරක්ගොඩ පිහිටි තාරුකා මණ්ඩප ශ්‍රවණාගාරයේදීය. ඒ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙනි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 338 දෙනෙකු සඳහා සින්නක්කර ඉඩම් ඔප්පු සහ නිවාස ආධාර මෙහිදී ප්‍රදානය කෙරිණ.

මේ වන විට නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල සිටින අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කර ගනිමින් විවිධ වූ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස වැඩසටහන සහ "මිහිඳු නිවහන" නිවාස වැඩසටහන ඒ අතරින් ප්‍රධාන වේ. තවත් නිවාස වැඩසටහන් රැසක් එම අධිකාරිය විසින් ක්‍රියාත්මක කොට තිබේ.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක හිමිකම් ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ මෙම වසරේදී හිමිකම් ඔප්පු 1,500 කට වැඩි ප්‍රමාණයක් ලබාදීමටද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සැලසුම් සකස්කර ඇත.

**● වසර 20 නිවාස ලාභීන් 1890 ට සින්නක්කර ඔප්පු ලබා දී අවසන්.**





නගර සැලසුම් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම, නාගරික හා ග්‍රාමීය ජනතාවගේ නිවාස සිහිනය සැබෑ කිරීම, හිමිකම් ඔප්පු සහ නිවාස ණය ලබා දීම ආදිය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ කටයුතු අතර ප්‍රධාන වේ.

**● හිමිකම් ඔප්පු සහ නිවාස ආධාර දිස්ත්‍රික් මට්ටමින් ලබාදීම ඇරඹේ.**

හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 197 දෙනෙකුට ඉඩම් බලපත්‍ර සහ ප්‍රතිලාභීන් 43 දෙනෙකුට ඉඩම් දීමනා පත්‍ර මෙහිදී ලබා දුන්නේය. එමෙන්ම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පොළොන්නරුව සි.අයි.සි. නිවාස යෝජනා ක්‍රමයේ නිවාසලාභීන් 86 දෙනෙකුට සින්නක්කර ඉඩම් ඔප්පු සහ ප්‍රතිලාභීන් 12 දෙනෙකුට "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස වැඩසටහන යටතේ රුපියල් මිලියන 2.3 ක් වටිනා නිවාස ආධාරද මෙහිදී පිරිනැමිණි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ඇති ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පසුගිය වසර සහ මේ වසරේ ගතවූ කාලය තුළ පමණක් දිවයින පුරා නිවාසලාභීන් 1,890 දෙනෙකු සඳහා සින්නක්කර ඔප්පු ලබා දීමට කටයුතු කර තිබේ. ඉදිරියටත් ජනතාවට සහන සලසමින් ඔවුන්ගේ නිවාස සිහිනය සැබෑ කරන්නට කැප වී කටයුතු කිරීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරම යුතුකමකි.

ඡේයා රූ - නලින් හේවාපතිරණ

නිහාර චාමික පෙරේරා

# හද අඳි රේඛා



## විවාහය

එකෙක් මත්තෙම හුස්ම රදන්නැති
එකෙක් මත්තෙම හීන දකින්නැති
එක කොලයකට පමනක් සීමාවී ඇති
විවාහය ඇයි මෙතරම් මුලාවක්ව ඇති

සතුටුයි කියුවත් දුකක්ම වී ඇති
ලොවට හොරා දුක සගවනා ඇති
ලොවක් දන්නා එය රහසක්ව ඇති
ඉතින් දැන දැනත් දුක් වුවමනා නැති

- ශිහාරා බණ්ඩාර -

## මගේ නොවුණු

නොලැබෙනා මල් කැකුළු
රහසේ ගෙනැවිත් රැන්දු
සුළග නුඹ හරි නපුරු
මටම ඇයි මේ වියරු
වෙන ගසක ඉති රුසිරු
බබලමින් නෙක සැරසූ
සුළග ඇවිදින් විසිරූ
මලක් මා මත රැඳුණු
සුවද මා මන බැඳුණු
පහස සියොලග දැවුණු
මගේ හිස මත පිපුණු
මලකි නුඹ මගේ නොවුණු

- නිර්ණාමික -



## නොමැලෙකන හැඟුම

හැගුම්බර හිත
කඳුළු සැලුවද අපමණ
ජීවිතේ පුරාවට
පැතුවේ එකම ආදරයයි
හැම දින...
එබැවින් මතු හැමදින
නොයනු මා හැර...
ජේසුනි රැකගන්න
නුඹ සැමදින
මා පැමිණෙන තුරාවටම...

- ධනු -

## මගේ පැතුම

නොලැබුණත් වැහි බිඳක්
ඉරි තැලුණු මගේ ලොවට
එකම එක පැතුමක්වත්
සිනාසලා පීදෙන්නට
තැවෙන්නේ නෑ මා
රුදුරු වූවාට ගිම්හානය
වස්සානය බලමි මම නෙතින්
කඳුළු බිඳක් ගිලිහුණාට
බොල් අහසත් දුක් වුණ දා
අරන් ඒවී මගේ ලොවට
ලස්සන මල් වසන්තයක්
ඒ වසන්ත හිල්තුරුමත
පිපෙන හැඟුම් මල් ගොන්නට
මුදු සුවඳක් වගේ වේවි
හෙට දිනයේ මගේ පැතුම්...

- දිල් -

## ආවර්ජන

රැඳීතියේවා මැකී නොයේවා
පෙම් සටහන් අපගේ
සීගිරි පවුරේ කැටපත් පවුරේ
ඇඳි සිතුවම් වාගේ

- නුවන් දිනේන්ද්‍ර -

## කුමරියණේ

දහසකුත් මතකයන් අතර
නුඹේ මතකය සිතේ රජකරයි
සැමකල්.
නිමක් නැති පැතුමන් අතර
මගේ සිත හඬා වැටෙයි
සියදහස් වර.
නුඹ ගැන හැර
වෙනලොවක් ගැන සිතෙන්නේ කෙලෙස
මගේ ආත්මය නුඹ නම්
මගේ කුමරියණේ

- නුවන් දිනේන්ද්‍ර -

## නුඹ....

මා වස්සානයට ආදරය කරනවා
ඒ මුළු වසත් සමයම ඔබ සමග නිසා
ඉරි තැලුණු ඉඬෝරයට මා
ඊටත් වඩා පෙම් බඳිනවා
ඒ කටු පිරුණු මාවත
අපි එක්ව එළිපෙහෙළි කළ නිසා
දිගු කරන දෑත සමග
ඔබයි සිතිය යුත්තේ යනවාද
තව දුර....

- උපුටා ගැනීමකි : මුහුණු පොතෙන් -

මේ පිටුව ඔබගේය.
ඉතිං ඔබගේ සිතෙහි මැවෙන අලුත් අදහස්, කවි විතරක් නොව නිසඳැස්වලටත් මේ පිටුවේ ඉඩ ඇත.
ඔබේ නිර්මාණ අපිට එවන්න...
වට්සප් අංකය - 0773135594

# City NEWS

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිළ ඊ පුවත් පත

කලාප 08

2023 ජුනි 01


# XPRESS PEARL



## අනතුරින් විපතටපත් ධීවරයන්ට රුපියල් මිලියන 1000ක වන්දි මුදල් ලබා දී අවසන්..

නාලක සංජීව දහනායක

මෙරට මුහුදු තීරයේදී ගිනිගෙන විනාශයට ලක්වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර හේතුවෙන් අගතියට පත් ධීවරයින් 300 දෙනෙකුට වන්දි මුදල් ප්‍රධානය කිරීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදුකෙරිණ.

එම නෞකා අනතුර හේතුවෙන් අගතියට පත් ධීවර ප්‍රජාවට අංශ 27ක් යටතේ අදියර තුනකට මේ වනවිට රුපියල් මිලියන 1000ක පමණ වන්දි මුදලක් ලබාදී ඇත.

මේ වනවිට ධීවරයින් 1000ට ආසන්න පිරිසකට වන්දි ලබාදී ඇති අතර අමාත්‍යවරය විසින් පසුගියදා ප්‍රධානය කරනු ලැබුවේ සිව්වැනි අදියරේ වන්දි මුදලය.

මෙරට සාගර තීරයේදී ගිනි ගැනීමට ලක්වූ එක්ස්ප්‍රස් පර්ල් හා නිව් ඩයමන්ඩ් නෞකා අනතුරු දෙක සම්බන්ධයෙන් සොයා බැලීමට පාර්ලි-මේන්තු තේරීම් කාරක සභාවක් පත්කළ යුතු බව ද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පසුගියදා සඳහන් කළේය.

# මධ්‍යම පාංතිකයන් වෙනුවෙන් ඉදිරි වසර 3දී නිවාස ව්‍යාපෘති 5ක්.

## ව්‍යාපෘති වටිනාකම රුපියල් බිලියන 25යි.

නිහාර චාමික පෙරේරා

මධ්‍යම පාංතිකයන් වෙනුවෙන් රුපියල් බිලියන 25ක වටිනාමකින් යුතු නිවාස ව්‍යාපෘති පහක් ඉදිරි වසර තුන තුලදී ක්‍රියාත්මක කරන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

මෙම නිවාස ව්‍යාපෘතිය නිවාස 866න් සමන්විත වන අතර වැලිසර, නිට්ටඹුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, අතුරුගිරිය, කඩුවෙල ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ ඇති නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් මෙම නිවාස ව්‍යාපෘති ඉදිකරනු ලබයි.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරන්නේ මෙම නිවාස ව්‍යාපෘති පහ අතරින් නිට්ටඹුව හා වැලිසර නිවාස ව්‍යාපෘති දෙකෙහි ඉදිකිරීම් කටයුතු මෙම වසර ඇතුළදී ආරම්භ කරන බවයි.

පිටුව 02

# පැරා ඔලිම්පික් රන් පදක්කම් ලාභී දිනේෂ් ප්‍රියන්තට නිවසක්



සේයා රූ - නලින් හේවාපතිරණ

නිහාර චාමික පෙරේරා

2020 වසරේ ජපානයේ ටෝකියෝ නුවර පැවති පැරා ඔලිම්පික් තරගාවලියේ හෙල්ල විසිකිරීම ඉසව්වෙන් ලෝක වාර්තාවක් සමගින් රන් පදක්කම දිනා ගන්නා ලද දිනේෂ් ප්‍රියන්ත මහතාට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා දුන් නිවසේ සින්නක්කර හිමිකම් ඔප්පුව ප්‍රදානය කිරීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදුවිය.

රටට කීර්තියක් අත්කර දුන් දිනේෂ් ප්‍රියන්ත ක්‍රීඩකයාට එවකට අග්‍රාමාත්‍යවූ මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2022 වසරේ ජනවාරි මස 20 වනදා කොම්පඤ්ඤවීදිය මෙට්‍රෝ හෝම්ස් නිවාස ව්‍යාපෘතියෙන් නව නිවසක් ලබාදෙනු ලැබිණි.

පිටුව 02

# බස්නාහිර මහනගර සංවර්ධන සැලසුම කඩිනමින් ඇරඹේ.

අමිල දර්ශන හේරත්

ඉදිරි මාස තුන ඇතුළතදී බස්නාහිර මහනගර සංවර්ධන සැලසුම කඩිනමින් ආරම්භ කරන්නැයි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා බළධාරීන්ට උපදෙස් දෙයි.

පිටුව 02

# "ඔබට ගෙයක් - රටට හෙටක්"

## නිවාස ව්‍යාපෘතියේ වැඩ අවසන් නොවූ නිවාසවල වැඩ යළි ඇරඹේ

### මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 751ක මුදලක්.



අමිල දර්ශන හේරත්

ඔබට ගෙයක් - රටට හෙටක් නිවාස ආධාර ව්‍යාපෘතියේ වැඩ අවසන් නොවූ නිවාසවල වැඩ යළි ආරම්භ කිරීමට මහා භාණ්ඩාගාරය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 751ක මුදලක් ලබාදී තිබේ.

පිටුව 02

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ City News නිළ ඊ පුවත්පත සඳහා පිවිසෙන්න

# හොඳට නරකට නාගරීකරණය

නාගරීකරණය යනු ඕනෑම රටක සමාජ ආර්ථික සංවර්ධනයේ කැඩපතයි. අප රට සමාජ සංවර්ධනයෙහිලා ඉහළ ස්ථානයක පසු වුවද වාර්තාගත දත්ත වලට අනුව පසුගිය සමයේදී නාගරීකරණය ආශ්‍රිතව මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය.

නමුත් පසුගිය දශකය අවසානයේ පමණ සිට රට තුල සිදුවෙමින් පවත්නාවූ නොයෙකුත් සංවර්ධන ක්‍රියාදාම මෙන්ම ප්‍රජා විද්‍යාත්මක හා සමාජීය වෙනස්කම් නිසා 21 වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාවේ නාගරීකරණ රටාවේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි.

නවතම සමීක්ෂණයකින් හෙළිව තිබෙන්නේ අඩු මට්ටමක පැවති මෙරට නාගරීකරණය 2012 -2022 දස අවුරුදු කාලය තුළ 45% ක් දක්වා වර්ධනය වී ඇති බවයි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මෙම සමීක්ෂණය සිදුකර ඇත.

ඒ අනුව නගර හා ග්‍රාම නිර්මාණ පනත අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම සමීක්ෂණය සිදුකළ බව එහි අධ්‍යක්ෂ ජනරාල් ගාමිණී හේවගේ මහතා පවසයි.



**“2012 - 2022 දස අවුරුදු කාලය තුළ මෙරට නාගරීකරණය 45% දක්වා ඉහළ යයි.”**

ශ්‍රී ලංකාවේ නාගරීකරණය සම්බන්ධයෙන් අවසාන වරට සමීක්ෂණයක් සිදුව තිබෙන්නේ 2012 වසරේදීය. එම සමීක්ෂණයට අනුව මෙරට නාගරීකරණය 18% කි.

ජනගහණ ඝණත්වය, නිවාස, කිලෝමීටර 10ක් ඇතුළත පිහිටා ඇති සුපිරි වෙළඳසැල්, සුපිරි ඇඳුම් වෙළඳසැල්, ඉන්ධන හල්, බැංකු, පුද්ගලික පාසල් හා පුද්ගලික රෝහල්, කිසියම් ප්‍රදේශීය සභාවක ග්‍රාම නිළධාරී වසමක් තුළ පිහිටා ඇති තට්ටු නිවාස සංඛ්‍යාව, කුලී සහ බදු පදනම මත ලබාදී ඇති නිවාස, පළාත් පාලන ආයතන විසින් එකතු කරනු ලබන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක කෘෂිකර්ම අංශයේ නොවන රැකියා කරන පිරිස කොපමණද වැනි නිර්ණායක මත පදනම්ව කිසියම් ප්‍රදේශයක නාගරීකරණය මැන බලයි.

**“නාගරීකරණය හේතුවෙන් විශාල පරිසර ගැටලු රාශියක් පැන නැගී ඇත.”**



2012 වසරට පෙර මෙරට නාගරීකරණයේ මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළේය. නමුත් 2010 දශකය ආරම්භ වීමත් සමඟ විදුලිය, ගමනාගමනය, සන්නිවේදනය,සෞඛ්‍ය කටයුතු හා අධ්‍යාපන ක්ෂේත්‍රවල වර්ධනය මෙන්ම කර්මාන්ත වෙළඳම් වැනි ක්ෂේත්‍ර පුළුල් වීම සමග මෙරට නාගරීකරණය වේගවත් වී ඇත.

මෙරට තුළ නාගරික සංකල්පය මුලින්ම හමුවන්නේ රාජධානි සමය තුළදී ය. ඓතිහාසික මූලාශ්‍ර අනුව ලංකාවේ මුල්ම ප්‍රධාන නගරය අනුරාධපුරය විය. පැරණි නාගරික සංකල්පය නූතන නාගරික සංකල්පයට වඩා වෙනස් වූ ස්වරූපයක් ගනී. මුල්කාලීනව ගංගා නිම්න ආශ්‍රිතව වර්ධනය වූ ලාංකීය නගර පසුකාලීනව වැව් ජනාවාස දෙසට ද ව්‍යාප්ත විය.



**“නාගරික ප්‍රදේශවල පැල්පත් නිවාස වල ක්‍රමවත් හා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නොමැත.”**

ලංකාවේ නූතන නගර හා බැඳුණු වානිජ කාර්ය මත පදනම් වූ නගර බිහි වීම ආරම්භ වන්නේ යටත් විජිත සමය වන පෘතුගීසි හා ලන්දේසි පාලන සමය තුළදී ය.

එකල කොළඹ, යාපනය, මන්නාරම, මඩකලපුව හා ගාල්ල නාගරික මධ්‍යස්ථාන වශයෙන් වර්ධනයක් පෙන්නුම් කල අතර මේ නගර මුහුදු බඩ වරාය නගර වීම විශේෂත්වයකි. බ්‍රිතාන්‍ය පාලන සමයේදී වැවිලි කෘෂිකර්මන්තය සංවර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රවාහන මාර්ග කොළඹ සමග සම්බන්ධ වීම නිසා කොළඹ නගරය දිවයිනේ ප්‍රධාන ආර්ථික නාගරික මධ්‍යස්ථානය බවට පත් විය.අධික නාගරීකරණය විවිධ ගැටළුවලට උත්පත්තිය ලබාදෙයි. අප රට ආශ්‍රිතවද නාගරීකරණයේ ප්‍රධාන ගැටළු කිහිපයක් හඳුනා ගැනීමට හැකිය. ඒවා ආර්ථික, සාමාජීය හා පාරිසරික වශයෙන් ප්‍රධාන අංශ 03 ක් යටතේ ගොනුකල හැකිය. නාගරික ප්‍රදේශයක් තුල මෙම ගැටළු වෙන්කොට හඳුනා ගැනීමට නොහැකි වන්නේ එකකට එකක් බද්ධ වූ ගැටළු රාශියක් නාගරික ප්‍රදේශ තුල වර්ධනය වී ඇති බැවිනි.



**“අධික නාගරීකරණය ගැටළු රාශියක උපතයි.”**

නාගරික ප්‍රදේශවල ජීවත්වන වැඩි දෙනෙක්ට ස්ථිර රැකියා නොමැති අතර එනිසා බොහෝ දෙනෙක් අවිධිමත් අංශයේ රැකියාවල නිරත වේ. තවත් පිරිසක් මත්ද්‍රව්‍ය වෙළදාම, ගණිකාවෘත්තිය ,ගැට කැපීම වැනි සමාජ විරෝධී කටයුතුවල නිරත වෙයි.

නාගරික ප්‍රදේශවල දැකිය හැකි ප්‍රධාන ගැටලුවක් ලෙස නාගරික නිවාස හිඟය දැක්විය හැකිය. මෙනිසා මුඩුක්කු, පැල්පත් නිවාස බහුලව ව්‍යාප්ත වේ.

මෙම පැල්පත් නිවාස වල ක්‍රමවත් හා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නොමැති අතර පොදු වැසිකිළි පහසුකම් භාවිතා කරයි.

නාගරීකරණය හේතුවෙන් විශාල පරිසර ගැටලු රාශියක් පැන නැගී ඇත. නාගරික ප්‍රදේශවල අධික රථවාහන ධාවනය සහ කර්මාන්තශාලා වලින් නිකුත් කරන විෂ වායු මාර්ග නිසා වායු දූෂණය සිදු වේ. විශේෂයෙන්ම පරිසරය විනාශ කිරීම් සමගින් උග්‍ර වන ආපදා වැළැක්වීමට නොහැකිවනු ඇත.

අප ගත කරමින් සිටින්නේ අස්ථාවර හා අහිතකර දේශගුණික විපර්යාස සිදුවන කාල පරිච්ඡේදයක් ය. අපි එයට අලුතින් අහිතකර තවත් බොහෝ දේ එකතු කරමින් සිටින්නෙමු.

නාලක දහනායක

# ජනතාවට ව්‍යවසායකයෙක් වෙන්න අපි අවස්ථාව ලබා දී තිබෙනවා.



ප්‍රියන්ත රත්නායක
සභාපති
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**ප්‍රශ්නය - නාගරික ජනාවාස අධිකාරිය කියන්නෙ මොකද්ද? එහි කාර්ය භාරය මොකක්ද?**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ප්‍රසන්න රණතුංග කැබිනට් ඇමතිතුමාගේ සහ රාජ්‍ය අමාත්‍ය තේනුක විදානගමගේ මැතිතුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වනවා. මේ ආයතනය ජනාවාස සංවර්ධන වෙනුවෙන් දැවැන්ත මෙහෙවරක් ඉටු කරනු ලබනවා. ජනතාවගේ භෞතික පහසුකම් සහ මානව පහසුකම් සංවර්ධනය කිරීම අපගේ වගකීම වී තිබෙනවා.

තිරසාර ජනාවාස සංවර්ධනයක් වෙනුවෙන් අප ආයතනය කටයුතු සිදු කිරීමේදී විශේෂ අවධානය යොමු කර ඇත්තේ නාගරික ජනාවාස වල ජීවත් වන ජනතාවගේ භෞතික පහසුකම් සංවර්ධනය කිරීම උදෙසායි.

ආයතනය සතුව පවතින ඉඩම්වල නිවාස ව්‍යාපෘති ඉදිකර අඩු ආදායම්ලාභී ජනතාවට ලබා දීම අප සිදු කරනවා. එහිදී පුනස්ථාපන පදනම යටතේ සහ පුනස්ථාපන නොවන පදනම යටතේ මෙම නිවාස ලබා දීම සිදු වනවා. විවිධ නිර්නායක යටතේ නිවාසලාභීන් තෝරා ගන්නා අතර ඒ සඳහා අදාල පළාත් පාලන ආයතනවල සහයෝගය ලබා ගන්නවා.

එවැනි ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස අපිට අඟුලාන සයුරපුර මහල් නිවාස ව්‍යාපෘතිය හඳුන්වා දෙන්න පුළුවන්. වෙරළ ආශ්‍රිතව අනාරක්ෂිතව ජීවත්වූ ජනතාව උදෙසා ආරක්ෂිත නිවසක් ලබා දී ඔවුන්ගේ නිවාස සිහිනය මේ වනවිට සැබෑ කර තිබෙනවා.

කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල අප යටතේ ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘතිවල මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රමුඛ තැනක් ලබා දී තිබෙනවා. මේ ජනාවාසවල ජීවත්වන ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම අපිට තිබෙන ලොකුම අභියෝගයයි. ජනාවාස වල ජීවත්වන ජනතාව ව්‍යවසායකයින් බවට පත් බිහි කිරීමට හා ඔවුන්ව නගා සිටුවීමට ණය ලබා දීමේ වැඩසටහනක් ආරම්භ කර තිබෙනවා.

**ප්‍රශ්නය - නාගරික සංවර්ධන අධිකාරිය තියෙද්දි නාගරික ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් ඒ යටතේ තවත් ආයතනයක් මොකටද?**

නාගරික සංවර්ධන අධිකාරිය වගේම තමයි මේ ආයතනයත් නිර්මාණය කර තිබෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරියට විකල්පයක් ලෙස මෙය ආරම්භ කරලා නෑ. මෙය ආරම්භ කර තිබෙන්නේ නාගරික ජනාවාස සංවර්ධනය කිරීමටයි.

මෙම ආයතනය ආරම්භ කළ පසු මේ සඳහා අරමුදල් සපයා ගැනීමේදී නාගරික සංවර්ධන අධිකාරිය ඔවුන්ගේ සේවා සපයන්නගෙන් ලබා ගන්නා 1% මුදලක් අඩු පහසුකම් නිවාස ව්‍යාපෘතියේ අරමුදල වී තිබෙන්නේ. පසුගිය කාලේ වෙනවිට එය නතර කර මේ ආයතනයට මුදල් ලැබෙන ක්‍රමවේදයක් නෑ භාණ්ඩාගාර අරමුදල් ඇරෙන්න. ඉදිරියේදී දැනුවත් කිරීම් සිදු කර අවශ්‍ය කටයුතු සූදානම් කර මේ අරමුදල් ටික සපයා ගන්න කටයුතු කරනවා.

**ප්‍රශ්නය - නාගරික අඩු ආදායම්ලාභීන් ආශ්‍රිතව තිබෙන්නේ අවිධිමත් ජීවන රටාවක්. ඔවුන් සමඟ ගණුදෙනු කරන්නෙ කොහොමද?**

ඔවුන් වැරැදි ක්‍රියාවලට යොමු වීමට ඇති කාලපරිච්ඡේද අඩු කර ඔවුන්ව නිවැරැදි තැනට ගේන්න වැඩසටහන් ආරම්භ කර තිබෙනවා. දැනට එසේ ක්‍රියාත්මක කළ වැඩසටහන් වල ප්‍රගතිය 80% පමණ වෙනවා. එම දරුවන් දැන් ආගම දහම සංස්කෘතිය එක්ක ලැදිව ගමන් කරන බව අපට දක්නට ලැබෙනවා.

ජනාවාසවල ජීවත්වන ජනතාවට ව්‍යවසායකයෙක් වෙන්න අවස්ථාව ලබා දී තිබෙනවා. විශේෂයෙන් කතරගම මුතියංගමගම ජනාවාස ගම්මානයේ ජීවත්වන ජනතාව ස්වංරැකියාවල නියැලීමට අවශ්‍ය ශක්තිය අපි ලබා දෙනවා . ඔවුන්ට හරි මර්ගෝපදේශය ලබා දීම සිදු කරනු ලබනවා. අද ඔවුන් සංචාරක ව්‍යාපාරයට අලෙවි කරන්නන් බවට පත් කරන වැඩසටහනක් සිදු කරමින් යනවා. අඩු ආදායම්ලාභී පවුල්වල තරුණයින් ව්‍යවසායකයින් කිරීම අපේ අරමුණයි.

/අමිල දර්ශන හේරත්

# වෙරළ කලාපය ආදායම් උල්පතක්.



ආර්.ඒ.එස්. රණවක
අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව

**මෙ**රට වෙරළබඩ පරිසර තත්ත්වය වැඩි දියුණු කිරීම, වෙරළ තීරය සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම, වෙරළබඩ යටිතල පහසුකම් ආරක්ෂණය කිරීම, වෙරළබඩ ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම, වෙරළබඩ සම්පත් මත පදනම්වූ ආර්ථික සංවර්ධනය පහසු කරවීම සහ ප්‍රවර්ධනය කිරීම අප ආයතනයේ අරමුණු වනවා.

අප දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන කාර්යයන් රැසක් තිබෙනවා. හදිසි වෙරළ ඛාදන තත්ත්වයන්ගේ බලපෑම අවම කිරීම, දීර්ඝකාලීන වෙරළ ආරක්ෂණ විසඳුම් ලබා දීම, වෙරළතීර කළමනාකරණ ක්‍රමෝපායන් සැකසීම, වෙරළ පර්යේෂණ ව්‍යාපෘති සකස් කිරීම, වෙරළ විමර්ශනය කිරීම, සාගර තරංග මැනීම අධ්‍යනය කිරීම, වෙරළ සැලසුම් මාර්ගෝපදේශනය යාවත්කාලීන කිරීම, වෙරළ ආපදා සිතියම් සැකසීම, වෙරළ කලාප කළමණාකරණ සැලැස්ම යාවත්කාලීන කිරීම සහ වෙරළ කලාපයේ අනවසර ඉදිකිරීම් හා ජලස්කන්ධ පාලනය කිරීම ඒ අතර වනවා.

## ■ මෙරට ජනගහනයෙන් 30% ක් ජීවත් වෙන්නේ වෙරළ කලාපය තුළයි.

මෙම කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා අප ආයතනය විසින් වෙරළ කලාප කළමණාකරණ සැලැස්මක් පිළියෙල කර තිබෙනවා. මුලින්ම මෙවැනි සැලැස්මක් හදලා තිබෙන්නේ 1990 වසරේදීයි. මෙවැනි සැලැස්මක් හදපු දකුණු ආසියාවේ පළමු රට ලංකාවයි. මෙය වරින් වර යාවත්කාලීන විය යුතු බව පනත මගින්ම දක්වා තිබෙනවා. ඒ අනුව මෙම සැලැස්ම 1997, 2004, 2018 යන වසරවලදී යාවත්කාලීන වුණා. වසර පහකට වරක් මෙය යාවත්කාලීන විය යුතු නිසා 2023 වසරේදී නැවත මෙම සැලැස්ම සංශෝධනය කිරීමට බලාපොරොත්තු වනවා.

ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය යනු ගංගා 103 කින් පෝෂණය වන විවිධ භූ විෂමතා සහිත ගතික සමතුලිතතාවයක් පවතින පරිසර පද්ධතියක්. මෙය විවිධ තර්ජනවලට මුහුණ දෙමින් සිටිනවා.

මෙරට ජනගහනයෙන් 30% ක් ජීවත් වෙන්නේ වෙරළ කලාපය තුළයි. මෙරට භූමියෙන් 23% ක ප්‍රමාණයක් ඊට අයත් වනවා. මෙරට දිස්ත්‍රික්ක 14ක්ම වෙරළබඩ දිස්ත්‍රික්කයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 78 ක් මෙම කලාපයට අයත් වනවා. ඒ වගේම සංචාරක කර්මාන්තයට අදාළ හෝටල් ආදිය 70%ක්ම පිහිටා තිබෙන්නේ මේ තුළයි. රටේ ප්‍රධාන මාර්ග, දුම්රිය මාර්ග වැඩි කොටසක් මෙම කලාපය තුළ පිහිටා තිබෙනවා. ධීවර කටයුතු සම්පූර්ණයෙන් සිදු වෙන්නේ මෙම කලාපය තුළයි. ප්‍රධාන වරායන් සියල්ල පිහිටා තිබෙන්නෙත් වෙරළ කලාපය තුළයි.

වෙරළ කලාපය තුළ සිදු කරන ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා අප දෙපාර්තමේන්තුවෙන් අවසරය ලබා ගත යුතු වනවා. ඊට අදාළ බලපත්‍රයක් අපෙන් ලබා ගත යුතුයි. අපේ පනත අනුව එසේ නොකිරීම දඩුවම් ලැබිය හැකි වරදක්. ඒ අනුව වෙරළ කලාපය තුළ නිවාස, මහල් නිවාස, වාසස්ථාන ඉදිකිරීම, කර්මාන්ත හා වාණිජ ඉදිකිරීම්, සංචාරක හෝටල්, පිහිනුම් තටාක සහ ජලාශ්‍රිත ඉදිකිරීම්, වරාය හා ධීවර වරාය සම්බන්ධ ඉදිකිරීම්, මහාමාර්ග, පාලම් හා දුම්රිය මාර්ග ඉදිකිරීම, පොදු හෝ ආගමික ඉදිකිරීම්, වෙරළ උද්‍යාන සංවර්ධන කටයුතු, කැණීම් සිදු කිරීම යනාදී වෙරළ කලාපයේ භෞතික ස්වරූපය වෙනස් කිරීමට ඉඩ ඇති සියලුම සංවර්ධන කටයුතු සඳහා අප ආයතනයෙන් අවසරය ලබා ගත යුතු වනවා.

## ■ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා ස්ථාන 26ක් හඳුනාගෙන සංවර්ධන සැලසුම් සකස් කර තිබේ.

ඒ වගේම අපේ රටේ වෙරළ කලාපය තුළින් රටට විශාල ආදායම් උත්පාදනය කර ගන්න පුළුවන්. සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම, ඊට අවශ්‍ය අවසර ලබා දීම සිදු කිරීම ආදිය සඳහා දැනටමත් අප සැලසුම් සකස් කර තිබෙනවා. එවැනි ස්ථාන 26 ක් අප දැනට හඳුනාගෙන තිබෙනවා. එම ස්ථාන අදාළ ආයෝජකයින් සඳහාත් මේවන විට විවෘත කර තිබෙනවා.

/නිහාර චාමික පෙරේරා

### මධ්‍යම පාංතිකයන්...

නිට්ටඹුව නිවාස ව්‍යාපෘතිය කාමර තුනකින් යුතු දෙමහල් නිවාස 100ත් සහ කාමර දෙකෙහි නිවාස 30ත් සමන්විත වේ. එමෙන්ම වැලිසර නිවාස ව්‍යාපෘතිය නිවාස 408ත් සමන්විත වේ. එය කාමර දෙකෙහි නිවාස 204ත් සහ කාමර තුනෙහි නිවාස 204ත් සමන්විත වේ.

ජයවර්ධනපුර කෝට්ටේ නිවාස සංකීර්ණය නිවාස 160ත් සමන්විත වන අතර කාමර දෙකෙහි නිවාස 84ක් හා කාමර තුනෙහි නිවාස 72ක් හා අධිසුඛෝපභෝගී නිවාස 4ක් එම නිවාස සංකීර්ණයට අන්තර්ගත වන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පවසයි.

එමෙන්ම අතුරුගිරිය නිවාස සංකීර්ණය නිවාස ඒකක 60ත් සමන්විත වන අතර එම නිවාස කාමර දෙකකින් සමන්විතවේ. කඩුවෙල නිවාස ව්‍යාපෘතිය නිවාස 108ත් සමන්විත වන අතර එයද කාමර දෙකකින් සමන්විතය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ එම නිවාස ව්‍යාපෘති තුන ඉදිකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවයි.

නිට්ටඹුව නිවාස ව්‍යාපෘතිය ගම්මාන සංබල්පය යටතේ ඉදිකෙරෙන විශේෂ ව්‍යාපෘතියකි. එය රටේ සංවර්ධනය වෙනුවෙන් දායකවූ රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ පුරවැසියන් වෙනුවෙන් වෙන් කෙරෙන බවද අමාත්‍යවරයා පවසයි.

# කතු වැකිය

## සංවර්ධනය නැවත අරඹමු...!

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ආරම්භකර පසුගිය සමයේදී විවිධ හේතු නිසාවෙන් අතරමග නතර කර තිබූ සියලුම ව්‍යාපෘති නැවත කඩිනමින් ආරම්භ කරන ලෙසට විෂයභාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පසුගියදා සිය අමාත්‍යාංශ නිලධාරීන්ට උපදෙස් දී තිබුණි.

මෙම අමාත්‍යාංශය මහජනතාවට සෘජුව බලපාන අතිශයින්ම වැදගත් අමාත්‍යාංශයකි. පොදු ජනයාගේ හිසට සෙවණක් සැලසීමේ මහා භාරදූර කාර්යය පැවරී ඇත්තේ මේ අමාත්‍යාංශයටය. ඇමතිවරයා පවසන්නේ ඉදිරි කාලය තුළ දිවයිනේම නිවාස ගැටළුව විසඳීමටත්, නාගරික සංවර්ධනය විධිමත් කිරීමටත් තමන් පෙරමුණ ගෙන ක්‍රියා කරන බවයි. අමාත්‍යාංශය පවසන්නේ ඒ සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග දැනටමත් ගෙන තිබෙන බවයි.

මෙරටට සංවර්ධන යුගයක් නිර්මාණය කරදුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයයි. එහෙත් කොරෝනා වයිරස වසංගතය, ආර්ථික අර්බුදය, අරගලය වැනි කරුණු හේතුවෙන් පසුගිය සමයේදී ආරම්භ කළ බොහෝ ව්‍යාපෘති නතරව තිබුණි.

**උපදේශකත්වය**
ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්
ප්‍රදීප් අනුර කුමාර
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

**සංස්කරණය**
නාලක දහනායක

**පිටු සැකසුම**
ධනුෂිකා කුමාරි

**විශේෂාංග ලිපි**
නාලක දහනායක
නිහාර චාමික පෙරේරා
අමිල දර්ශන හේරත්
මුහීරා අබු බක්කර්

**සෝදුපත් බැලීම**
පී.බී.එස්. සම්පත්

**සම්බන්ධීකරණය**
දිලිනි කෞෂල්‍යා
නදුන් තාරක
නිලංක නිරෝෂන්

**ඡායාරූප**
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ
සරත් ජයතිලක

**පරිගණක සහය**
සචිඳු සංකල්ප
තිළිණ නිර්මාල්

### පැරා ඔලිම්පික්...

මෙම නිවසෙහි වටිනාකම රුපියල් මිලියන 14.2කි. එය කාමර දෙකකින් යුතු වර්ග අඩි 764 ක නිවසකි. දිනේෂ් ප්‍රියන්ත ක්‍රීඩකයා විවාහකයෙකු වන අතර දරුවන් 3 දෙනෙකුගේ පියෙකි. ඔහුගේ ගම අනුරාධපුර ඉපලෝගමය. ඔහුගේ ක්‍රීඩා කටයුතු සඳහා පහසුව පිණිස මෙම නිවාස ලබා දී තිබේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්.එස්. සත්‍යානන්ද, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත්, අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් රණවීර යන මහත්වරුන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

### "ඔබට ගෙයක් - රටට හෙටක්"

ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිකමින් මෙම නිවාස ව්‍යාපෘතිය මාස හතරකට ආසන්න කාලයක් නතරවී තිබුණි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා රජයෙන් කළ ඉල්ලීමකට අනුව මහා භාණ්ඩාගාරය විසින් මෙම මුලද ලබාදී ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවසන්නේ අදාළ මුදලින් ඔබට ගෙයක් - රටට හෙටක් නිවාස ආධාර ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භ කර මේ වනවිට නතරවී ඇති නිවාස 2265ක ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරන බවයි.

එම නිවාස 2265 ඉදිකිරීම් කටයුතු මේ වනවිට විවිධ අදියරවල පවතී. ඒ අනුව අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට උපදෙස් දී තිබෙන්නේ එම මුදල් යොදාගනමින් "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භකර, අවසන්කිරීමට නොහැකිවූ සියලුම නිවාසවල ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන ලෙසයි.

### බස්නාහිර මහනගර...

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමග පසුගියදා පැවති සාකච්ඡාවකදී එම අධිකාරියට උපදෙස් දී තිබුණේ බස්නාහිර මහනගර සංවර්ධන සැලසුම යළි ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩ කටයුතු ආරම්භ කරන ලෙසයි.

බස්නාහිර මහනගර සංවර්ධන සැලසුම සකස් කර ඇත්තේ 2016 වසරේදීය. සිංගප්පූරු නගර නිර්මාණ ශිල්පි ආයතනයක් විසින් එය සකස් කර තිබේ. කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක 3 සඳහා මෙම සැලැස්ම සකස් කර ඇති අතර ඒ යටතේ මෙම දිස්ත්‍රික්ක ආර්ථික, වාණිජ, සංස්කෘතික සහ පාරිසරික වශයෙන් සංවර්ධනය කෙරෙනු ඇති.

මෙම සැලැස්ම යටතේ මීරිගම සහ හොරණ කර්මාන්ත නගර ලෙසත්, මාළඹේ සහ හෝමාගම තාක්ෂණ නගර ලෙසත්, බදුරලිය සහ අවිස්සාවේල්ල වැවිලි නගර ලෙසත්, මීගමුව සහ වත්තල වෙරළබඩ සංචාරක නගර ලෙසත්, කටාන සහ කටුනායක ප්‍රවාහන හා ගුවන් නගර ලෙසත්, කැස්බෑව සුඛෝපභෝගි නිවාස නගරය ලෙසත්, මුතුරාජවෙල පරිසර කලාපය ලෙසත් සංවර්ධනය කෙරේ. එමෙන්ම කොළඹ වාණිජ නගරය ලෙසත්, ශ්‍රී ජයවර්ධනපුර පරිපාලන නගරය ලෙසත් සංවර්ධනය කෙරෙනු ඇති.

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com



# කැළි කසල හා අපි

කැළිකසළ යනු ඉවත දමන දේවල් වුව ද ඒ මගින් අපට ප්‍රයෝජන රාශියක් ලබා ගත හැකි ය. කැළිකසළ මගින් අපගේ ජීවන රටාව යම් ඉහළ මට්ටමකට ගැනීම අලංකාර හා සාරවත් ගෙවත්තක් ලබා ගැනීමට පොහොර ගෙදරදීම සාදා ගැනීමට හැකි විම යන තවත් වාසි රාශියක් ඇත. එහෙත් මිනිසා මෙවැනි කිසි ප්‍රයෝජනයක් නොමැතිව කසළ අවිධිමත් ලෙස බැහැර කරයි. එම නිසා සතුන් මෙම කැළිකසළ ආහාරයට ගෙන ලෙඩ රෝග සාදාගෙන මිය යනු දැකිය හැකි ය.

කැළිකසළ බැහැර කරනවා නම් අප ඒවා නිසි ලෙස බැහැර කළ යුතු ය. කොළ රොඩු, ඉවතලන ආහාරවල කොටස් එළවළු හා පලතුරුවල කොටස් එකතු කර නිවසේ දී ම කොම්පෝස්ට් පොහොර සාදා ගත හැකි ය. තවද අපට එය සිදු කළ නොහැකි නම් අප කළ යුත්තේ ප්ලාස්ටික්, පොලිතින් හා ඉවතලන අපද්‍රව්‍ය වෙන වෙන ම එකතු කර ප්‍රතිචක්‍රීකරණ රථවලට ලබා හැකි දීමටයි.

**● කොළඹ නගරයේ පමණක් දිනකට කැලිකසල මෙට්‍රික් ටොන් 600ට අධික ප්‍රමාණයක්**

මනා ලෙස කැළිකසළ බැහැර නොකිරීම මගින් මිනිසා හා සතුන් යන දෙපක්ෂයට ම කරදර රාශියකට මුහුණ දීමට සිදු වේ. මෙම තත්ත්වය නැති කර ගැනීමට අප පුරුදු පුහුණු විය යුතු ය.

විශේෂඥ තාක්ෂණික කමිටුවක් විසින් නාගරික සහ නිවාස අමාත්‍යංශ ලේකම්වරයාට ලබාදී ඇති වාර්තාවකට අනුව සාමාන්‍යයෙන් කොළඹ නගරයේ පමණක් දිනකට කැලිකසල මෙට්‍රික් ටොන් 600ට අධික ප්‍රමාණයක් එකතුවන බව පෙන්වා දී ඇත.

මෙම කසල කැලණිය ප්‍රදේශයට රැගෙන ගොස් එතැන් සිට දුම්රිය මගින් අරුවක්කාලු ප්‍රදේශයේ අක්කර 265ක භූමි ප්‍රදේශයක මෙම සනීපාරක්ෂක කසළ රඳවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක අතර, එමඟින් අක්කර කිහිපයක්ම උද්‍යානයක් ලෙස අලංකාර කිරීම, ආරක්ෂක භූමි සහ පරිසර හිතකාමී තත්ත්වය ඇති කිරීමට වෙන් කර තිබීම ද විශේෂත්වයකි.

**●කැළිකසළ මගින් අපගේ ජීවන රටාව යම් ඉහළ මට්ටමකට ගැනීමට අවස්ථාව කර ගත හැක**

මෙරටතුළ කැළි කසල බැහැර කිරීමට ප්‍රජාවගේ දායකත්වය ලැබීම ගැන ගැඹුරින් සාකච්ඡා කළ යුතුය. අප රටෙහි ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට ඇති ප්‍රබලම අභියෝගය වනුයේ අපද්‍රව්‍ය වෙන් කිරීමට ප්‍රජාව නොපෙළඹීමයි. ඒ හේතුවෙන් අපද්‍රව්‍ය කළමාණාකරණය කිරීමේ ක්‍රියාදාමය සාර්ථක කර ගැනීම මිරිඟුවක් වී ඇත. අප උත්සාහ කළ යුත්තේ මෙම තත්වය වෙනස් කරමින් මේ සඳහා පවතින ජනතා ආකල්පය දැනුම සහ අවබෝධය හැකිතාක් පෝෂණය කිරීමයි.

කසල අවම කිරීම සඳහා ප්ලාස්ටික් භාජන හා පොලිතීන් එක්වර භාවිතයෙන් ඉවත නොදමා නැවත නැවතත් පාවිච්චියට ගැනීම ඉතා සාර්ථක ක්‍රමයකි. විශේෂයෙන් සුපිරි වෙළඳසැල්වලින් ඔබ මිලදී ගන්නා දෑ සඳහා වෙන වෙනම කුඩා පොලිතින් බෑග් වලට බහා ලබාදීම සිරිතකි. පොලිතින් බෑග් කිහිපයක් වෙනුවට එක බෑගයකට අවශ්‍යය බඩු සියල්ලම ඔබම ඇසුරුම් කරගතහොත් බොහොම පහසුවෙන් අනවශ්‍ය ලෙස පොලිතින් බෑග් ගෙදර ගෙන ඒම අඩු කරගැනීමට හැකියාව ඇත. එමෙන්ම එදිනෙදා බඩු භාහිරාදිය ගෙන ඒමේදී නිවසින් ඒ සඳහා අවශ්‍ය රෙදි හෝ පන් මල්ලක් රැගෙන යෑමට අප පුරුද්දක් ඇති කර ගත යුතුය.

අමිල දර්ශන හේරත්

# රට කළඹන අනවසර ඉදිකිරීම්

රට පුරාම බැලූ බැලූ අත ඇත්තේ යෝධ ගොඩනැගිලිය. මේවා ප්‍රමිතියට හැදූ ඒවා වේ. ඒ අතර ප්‍රමිතියෙන් තොරව ඉදිකළ අවිධිමත් ඉදිකිරීම්ද බොහෝමයකි. මේ අවිධිමත් ඉදිකිරීම් නිසාවෙන් ජීවිත අහිමිවූ අවස්ථාවන්ද නැතුවා නොවේ. 2017 මැයි මාසයේ 18 වැනි දින, වැල්ලවත්තේ ගොඩනැගිල්ලක් කඩා වැටී 26 දෙනෙක් තුවාල ලබා රෝහල්ගත කරනු ලැබූහ. එය ද පස් මහල් ගොඩනැගිල්ලකි. එයට හේතු ලෙස දක්වනු ලැබූයේ එහි අලුත්වැඩියා කිරීම් නිසියාකාරව නොකිරීම ය.

ආසන්නම සිදුවීම මහනුවර බූවැලිකඩ පස්මහල් නිවසක් නාය යෑමය. මහනුවර නගරාසන්නයේ බූවැලිකඩ පස් මහල් නිවෙසක් කඩා වැටීමෙන් විපතට පත්වූයේ එම යෝධ නිවෙසට කිසිදු සම්බන්ධයක් නොතිබුණු අහිංසක පවුලකි. එය කඩා වැටීමෙන් මාස එක හමාරක අත දරුවකු සමග ඇයගේ මව හා පියා ද මිය ගියහ. බදුල්ල, මහනුවර වැනි කඳුකර ප්‍රදේශවල එවැනි අවිධිමත් අනවසර ඉදිකිරීම් වැඩි වශයෙන් දක්නට ලැබේ.

**● අවිධිමත්ව සිදුකෙරෙන ඉදිකිරීම් නිසාවෙන් පරිසර අලංකාරය නැතිවේ.**

අනවසර යැයි කියන්නේ මහ නගර හෝ නගර සභා වෙත නොගොසින් ඉදිකර ඇති ගොඩනැගිලිවලට පමණි. අප රටේ විශාල වශයෙන් යෝධ ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ වූයේ මීට දශක දෙක තුනකට ඉහතින් ය. එවන් යෝධ ඉදිකිරීම් විශාල ආයෝජන සමගින් කෙරෙන්නේ නවීන තාක්ෂණය සමගින් ය.එබැවින් කොළඹ හා අවට නාගරික ප්‍රදේශවල ගොඩනැගිලි කඩා වැටීම් විරල සිදුවීමක් විය හැකිය. ඉඩම් හිඟ තදබදය ඇති නාගරික ප්‍රදේශවල අනුමත සැලැස්ම සහ ඉදිකළ ගොඩනැගිලි අතර සැලකිය යුතු වෙනස්කම් තිබියදීත් ඒවා පදිංචියට හා වෙනත් කටයුතු සඳහා සුදුසු යැයි සහතික කෙරේ.

එබැවින් මෙම බොහෝ ඉදිකිරීම් භූමියට ඔරොත්තු දිය හැකි ආකාරයෙන් සැලැසුම් නොකෙරෙන අතර ශක්තිමත් අත්තිවාරමක් නොමැතිවීම හේතුවෙන් බොහෝවිට හානි සිදුවේ.

නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ මහල් හතරකට වැඩි නව ගොඩනැගිලි ඉදිකිරීම අප්‍රේල් මස (1) සිට සීමා කිරීමට රජය තීරණය කළේය. නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන අනුව රෙගුලාසි පැනවීමට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කළ යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙමින් මෙම තීරණය ගෙන ඇත.

**● බොහෝ ඉදිකිරීම් භූමියට ඔරොත්තු දිය හැකි ආකාරයෙන් සැලැසුම් නොකෙරේ.**

අවිධිමත් ඉදිකිරීම්, ප්‍රදේශය තුල පැතිරුණු අඩු පහසුකම් සහිත ජනාවාස,ප්‍රමිතියෙන් තොර පානීය ජල මූලාශ්‍ර, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම සහ නිසි කාණු පද්ධතියක් නොමැතිකම වැනි කරුණු හේතුවෙන් නගරයක සුන්දරත්වය අඩුව යෑමට හේතුවේ. අවිධිමත්ව සිදුකෙරෙන ඉදිකිරීම් නිසාවෙන් පරිසර අලංකාරය නැතිවේ. එයම සංචාරක ආකර්ෂණයටද දැඩි බලපෑම් එල්ල කරයි.

ආර්ථිකය ගොඩනැගීම යනු ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. ඒ සඳහා විධිමත් වූ සංවර්ධන සැලැස්මක් අනුව අපි ගමන් කිරීමට කාලය එළඹ ඇති බව පමණක් ලියා තබමු.





නාලක දහනායක


City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
Magazine
මෙවර City News Magazine Youtub නාලිකාව මගින් විකාශය වන්නේ කොටුගොඩ මදුරුවිට ග්‍රාමයේ ඇති රන් අක්කා විල සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිළිබඳවයි